Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa P

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය - 15 වන සතිය

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 07

සැකසුම - අචලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

# පාඩම :- රබන් ගීත ගායනය.

## රබන් ගීත මෙරටට පැමිණි කතා පුවත...

- පොළොන්නරු යුගයේ මුලින්ම රජකළ පල පළවෙනි විජයබා රජු මලයාසියානු කුමාරියක වූ තිලෝකසුන්දරී සමඟ විවාහ විය.
- එම මංගල උත්සවයේ රබන් නර්තනය කළ බව ඉතිහාසයේ සඳහන් වේ.

*පළමුව මෙලක තුළ - විජයබා නිරිඳුන් රජ කළ*
*විවා බඳිනා කළ - රබන් නර්තය ලකට මුල්විය*

- රබානේ ඉතිහාසය පොළොන්නරු යුගය තෙක් දිව යයි.
- ඒ අනුව ලංකාවේ රබන් යන නාමය අපට ලැබෙන්නේ අග්නිදිග ආසියාතික රට රටවලිනි.
- මෙම භාණ්ඩය මලයාසියාවේ රෙබන් නමින්ද තායිලන්තයේ රම්මාන නමින්ද බුරුමයේ රෙමාන යන නමින් ද හඳුන්වා ඇති බව පොතපතෙහි සඳහන් වේ.

## රබන් ගීත පිළිබඳ සංස්කෘතික පසුබිම...

- රබාන බොහෝ ඈතක කාලයේ සිට අද වන තෙක් ම විවිධ උත්සව අවස්ථාවල දී යොදා ගන්නා ලදී.
- <u>රබන් නැටුම</u> හා සම්බන්ධ ගීත <u>රබන් ගීත</u> වේ.
- මෙම ගීත රබන් කරකවමින්, රබන් නර්තනයේ යෙදෙමින් ගායනය කෙරේ.
- රබාන <u>ආතත</u> වර්ගයට අයත් ය.
- අත් රබාන හා බංකු රබාන ලෙස රබන් වර්ග දෙකකි.
- දකුණේ නාකුළුගමුව, ගලගෙදර, හොරණ, උඩුව, කෙහෙල්හේනාව වැනි ප්‍රදේශ රබන් කණ්ඩායම් පිළිබඳ ප්‍රසිද්ධියක් උසුලයි.
- දැනට ප්‍රසිද්ධම කණ්ඩායම වනුයේ මහනුවර "හාරිස්පත්තුව" කණ්ඩායමයි.





අත් රබාන



බංකු රබාන

උඩපළ ගත්තත් වට්ටක්කා

බිමපළ ගත්තත් වට්ටක්කා

උඩපළ ගත්තත් බිමපළ ගත්තත්

පුංචි පුංචි ගෙඩි වට්ටක්කා

## රබන් ගීතවල සංගීතමය ලක්ෂණ...

- රබන් ගීත විවිධ නාද මාලා අනුව ගායනාය කෙරේ.
- සරල මෙන්ම සංකීර්ණ නාදමාලා ද ඇත.
- තානමකින් සමන් සමන්විතය.
- මෙම ගීතවල තනු ප්‍රදේශ වශයෙන් විවිධතා හා පෙන්වයි.
- නර්තනයට සුදුසු රිද්මයක් මෙම ගීත වල අන්තර්ගතව ඇත.
- ගැමි ගී ගණයට අයත් වේ.
- මෙම නර්තනය විශේෂයෙන්ම නුවර පෙරහැරේ දක්නට ලැබේ.
- විවිධ පළාත් වල පවත්වන පෙරහැර, ජාතික උත්සව, විවිධ ප්‍රසංග ආදියේ දී ද රබන් නැටුම් දක්නට ලැබේ.
- සරල තාල හා නාද රටා වලින් සමන්විතය.

### රබන් කරකැවීමේ දී ගයන කවි

තන තනම් දෙන තන තනම් දෙන තන තනම් දෙන - තානා
තින තිනම් දෙන තින තිනම් දෙන තින තිනම් දෙන - තීනා

අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්
ගත සිත බඳ සොලවා සළු පිළි නද කරමින්
සිතකට වත් නොගෙන නටති විදුලිය විලසින්
අහසට දමමින් අල්ලා රබාන දැතින්

නැටුමට රුසිරු මල පිට යන වැනි බඹරු
දකුණට සපිරු බඹරෙකු කැරකෙයි සොඳුරු
ඇසුමට මියුරු පවසන නද දෙන කිඳුරු
ලැබුමට ඉසුරු හැකි බව පෙනෙනවා සොයුරු

වේවැල රැගෙනා මුණ පිට රබාන තබනා
දහවල දිලෙනා සඳ මෙන් වට කැරකෙමිනා
වී ලොල් සිටිනා සැම සිත සන්තොස වෙමිනා
මේ ශිල්පයෙනා දුටු දන අත්පොඩි සලනා

එකවිට අල්ලා නවයක් ගෙන කැරකිල්ලා
දකුණට අල්ලා අතවට කර නැළවිල්ලා
නළලට ගල්ලා වේවැල පිට නැළවිල්ලා
රබාන අල්ලා අහසට දමමින් අල්ලා
මැදුම් තනි තිත

ඉතිරි පාද දෙක ද මෙම නාදමාලාව අනුව ගැයේ.

රබන් ගී
සඳුන් කොකුම් මොර සුගාන
මුදුන් කරලා වරල බඳින
රජුන් සමඟ ඇමති සිටින
ළඳුන් දුට ද රජගෙට යන

උරතල කැළ ඔඩිය ලෙන්ද
කරතල සපුමල ලෙසින් ද
දුර දුර ඉසි ගෝමරින් ද
ලඳ නුඹ හැර වෙන කොයින් ද

## රබන් කවි

### මැදුම් තනි තිත C 3/4

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | / | | | / | | | / | | |
| + | සප | ප | පම | ම | මග | රි | ග | ග | රි | ස | ස |
| + | අත | ක | ට | ගෙ | න | ර | බ | න් | පො | ඩි | ය |
| + | නිස | රි | රි | රිග | මග | රිග | රිස | ස | ස | – | – |
| + | ගස | ති | ඉ | සි | රු | වින් | SS | S | S | S | S |
| + | නිස | රි | රි | රිග | මග | රිග | ස | ස | රි | ග | රි |
| + | ගත | සි | න | බS | දS | සොS | ල | වා | S | ස | එ |
| + | ගග | රි | ග | රි | ස | ස | – | – | – | – | – |
| + | පිළි | න | ද | ක | ර | මින් | S | S | S | S | S |

## රබන් කවි

### මැදුම් තනි තිත F<sup>m</sup> 3/4

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | / | | | / | | | / | | |
| + | මස් | ස් | ස් | ස් | නි | ස්රි | ග් | රිස් | නි | ධ | ප |
| + | සඳු | න් | කො | කු | ම් | මොS | ර | සුS | ගා | S | න |
| + | පධ | නි | ධ | ප | ධ | ප | ම | ම | ම | ම | – |
| + | මුදු | න් | ක | ර | ල | ව | ර | ල | බ | දි | න |
| + | ගුගු | රි | ග | ම | ම | පධ | නි | ධ | ප | ම | ම |
| + | රජු | න් | ස | ම | ග | ඇS | ම | ති | සි | ටි | න |
| + | සස | නි | ධ | ප | ප | නි | ධ | ප | ම | – | ම |
| + | ළදු | න් | දු | ට | දැ | ර | ජ | ගෙ | ට | ය | න |

<u>පැවරුම</u>

- හිස්තැන් පුරවන්න.

1. රබන් ගීත අයත් වනුයේ ..................................... (ගැමි ගී/ සේ ගී) වලටය.
2. රබන් පද වාදනය කරනුයේ ..................................... (අත් රබානයි/ බංකු රබානයි).
3. රබන් පද වල අන්තර්ගත විශේෂිත කොටස ..................................... (අඩව්ව/ තානම) ලෙස හඳුන්වයි.
4. රබාන අයත් වනුයේ ..................................... (ආතත/ විතත).
5. රබාන මෙරටට පැමිණියේ ..................................... (වළගම්බා/ විජයබා) රජු කලය.

- හරි නම් හරි ලකුණ ද වැරදිනම් වැරදි ලකුණ ද යොදන්න.

1. සඳුන් කොකුම් දරු නැළවිලි ගීයකි. ( )
2. රබන් අත් රබාන හා බංකු රබාන ලෙස වර්ග කරයි. ( )
3. “තුන් තුඹ මල් තුනයි තුනයි” රබන් ගීයකි. ( )
4. “රෙබන්” යන නමින් හඳුන්වන්නේ ද රබානයි. ( )
5. රබන් ගී වේග රිද්ම ගණයට අයත් වේ. ( )